www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජී-8 බලවත්තු ලෙබනනයට එරෙහි ඊශ්‍රායල ආක්‍රමනය අනුමත කරති

## G8 powers sanction Israeli aggression in Lebanon

**කර්තෘ මන්ඩල ප්‍රකාශය**
**2006 ජුලි 18**

වොෂින්ටනය විසින් ඉහ සිට දෙපතුලට අවි ගන්වන ලද එක්සත් ජනපදයේ උපජීවී රාජ්‍යයක් වූ ඊශ්‍රායලය ලෙබනනයට එරෙහි මුර්ග ගුවන් ප්‍රහාර එල්ල කර ගත වූ හය වන දිනයේ දී, ඊශ්‍රායලයේ එම ක්‍රියාව සැබවින් ම අනුමත කරමින් ලෝකයේ ප්‍රධාන අධිරාජ්‍යවාදී රටවල නායකයෝ පසු ගිය සඳුදා අට දෙනාගේ කන්ඩායමේ (ජී-8) රැස්වීම අවසන් කලහ. එක්සත් ජනපදය සැපයූ යුද ගුවන් යානා විසින් එක්සත් ජනපදය සැපයූ බෝම්බ සහ මිසයිල වර්ෂාවක් ලෙබනනයේ නගර හා ගම් මත පතිත කරද්දී අඩු ගනනේ නාමික සටන් විරාමයක් වත් ඉල්ලා සිටීම වැලැක්වීමට බුෂ් පාලනාධිකාරය මූලිකත්වය ගත්තේ ය.

වර්තමාන අර්බුදය දෙපාර්ශ්වයට ම එක සේ දුක්ඛදායක ය යි - ඊශ්‍රායලයේ සිවිල් වැසියන් බෝම්බ ප්‍රහාරවලට ගොදුරු වන්නේ ය යන ආකාරයෙන් - පෙන්වීමට එක්සත් ජනපද මාධ්‍යයන් උත්සාහ කරන නමුත් යථාර්ථය ඊට වඩා බෙහෙවින් වෙනස් ය. ඊශ්‍රායලය ලෙබනන ජාතිකයන් 200කට වඩා මරනයට පත් කොට ඔවුන්ගේ රටට ඩොලර් බිලියනයකට වැඩි විනාශයක් කර තිබෙන අතර ඊට සංසන්දනාත්මකව ඊශ්‍රායලයන් මිය ගොස් ඇත්තේ 24 දෙනෙකි. ඉනුත් අඩක් පමන හිස්බුල්ලා භටයන්ට එරෙහි සටන් බිමේ දී මරුමුව පත් හේවායන් ය.

හිස්බුල්ලා රොකට්ටු සාපේක්ෂ වශයෙන් නොදියුනු ය, ඒවා නිවැරදිව ඉලක්කගත කල හැකි ද නො වේත රථ මාර්ග, පොදු ගොඩනැගිලි, බලශක්ති නිෂ්පාදනාගාර සහ වරාය පහසුකම් ඇතුලු නවීන ජීවන පහසුකම් හා බැඳුනු ඊශ්‍රායලය ලෙබනනය මත වැසි වස්සන රාත්තල් 500 ලේසර්-පාලිත මිසයිල සමග ඒවා සම කල නොහැකි ය. ඊශ්‍රායල නිලධාරීහු ලෙබනනය වසර 20ක් පස්සට තල්ලු කිරීමට - එනම් රට ම විනාශයේ මුවවිටට ගෙන ආ සිවිල් යුද්ධයේ පාතාලයට යලිත් ඇද දැමීමට ප්‍රසිද්ධියේ සපථ කර සිටිති.

ඊශ්‍රායල සොල්දාදුවන් තිදෙනෙකු පැහැර ගෙන අනතුරුව ගාසාවේ හා දකුනු ලෙබනනයේ සිට ඊශ්‍රායලයට රොකට් විදීම පාවිච්චියට ගනිමින්, පසු ගිය ඉරිදා ජී-8 සමුලුව විසින් සම්මත කරන ලද යෝජනාව වර්තමාන මැද පෙරදිග අර්බුදයේ වගකීම හමාස් සහ හිස්බුල්ලා සංවිධාන මත පැවරී ය. එම සංවිධාන විසින් කරන ලද ප්‍රකෝපකරනයක් නිසා වත්මන් යුද්ධය ඇති වී යැයි කරන මෙම කියා පෑම කුනු පචයකි. ලෙබනනය තුලට තවත් යෝධ ආක්‍රමනයක් එල්ල කිරීමේ සූදානම හා පූර්වරංගය ඊශ්‍රායලය විසින් සැලසුම් කෙරුනේ මීට අවුරුදු ගනනාවකට පෙර සිට ය; ඊශ්‍රායලය දිගු කලක් තිස්සේ සකසා ගත් තම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාජ හේතුවක් ලෙස හිස්බුල්ලා ප්‍රහාරය සරලව ම ප්‍රයෝජනයට ගත්තේ ය.

මෙම ආක්‍රමනයට අන්තර් සම්බන්ධිත ඉලක්ක දෙකක් පවතී. ඉන් එකක් ඊශ්‍රායල පාලක ප්‍රභූවට සුවිශේෂී වේ. අනෙක සිය ඇමරිකානු අනුග්‍රාහකයන් සමග ඊශ්‍රායල පාලකයන් විසින් බෙදාහදා ගනු ලැබේ.

අන් සෑම විට ම මෙන්, ඊශ්‍රායල පාලක පන්තිය තම යුද්ධමය ක්‍රියා යුක්ති යුක්ත කර ගන්නේ, ඒවා තනිකර ම සිය ආත්මාරක්ෂාව සඳහා වන ඒවා වන්නේ යැයි ද තම ආරක්ෂාවට එල්ල වූ උග්‍ර තර්ජනයන්ට ප්‍රතිචාරයක් යැයි ද කියා පාමිනි. එහෙත් "ආරක්ෂාව" යන වචනයෙන් අදහස් වන්නේ දැනට යටත් කර ගෙන සිටින්නා වූ පලස්තීන ජාතිකයන් ද ඇතුලු මැද පෙරදිග අනෙකුත් සෑම රාජ්‍යයක් ම මුලුමනින් ම දන ගැසිය යුතු ය යන්න යත මැද පෙරදිග අන් කවර රාජ්‍යයක හෝ ආර්ථික සහ/හෝ යුද්ධමය නැගී සිටීමක් සියොන්වාදීන්ගේ ප්‍රාදේශීය අභිලාෂයන්ට බාධාවක් වනු ඇතැයි යන්න ගැන ඊශ්‍රායලය සැලකිලිමත් වෙයි.

හිස්බුල්ලා සංවිධානය මෙම යුද්ධයේ ඉලක්කය බවට පත්ව ඇත්තේ ලෙබනනය තථ්‍ය වසයෙන් ම ඊශ්‍රායල පිලිවෙතේ නම්‍ය උපකරනයක් බවට පරිවර්තනය කර ගැනීමට බාධාවක් ලෙස එම සංවිධානය පිහිටා ඇති බැවිනි. ලෙබනන-ඊශ්‍රායල දේශ සීමාව දිගට ම එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවන් යෙදීමට කරන ලද යෝජනාව අගමැති එහුඩ් ඔල්මර්ට් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ තිබෙන්නේ ද එහෙයිනි.

සඳුදා ක්නෙසට් හෙවත් ඊශ්‍රායල පාර්ලිමේන්තුවට කල කතාවක දී ඔල්මර්ට් පෙන්වා දුන් පරිදි, ඔහුගේ අරමුන වන්නේ හිස්බුල්ලා සංවිධානය දේශ සීමාවෙන් ඈතට තල්ලු කර දැමීම යත එය ඉටු කල හැක්කේ ඊශ්‍රායල ගොඩබිම් හමුදා පාවිච්චි කිරීමෙන් පමනකි, පසු ගිය වර්ෂයේ ලෙබනනයේ බලයට පත් එක්සත් ජනපදයේ ගැත්තර ආන්ඩුව විසින් යොදවනු ලබන ක්‍රිස්තියානි-ආධිපත්‍යයට යටත් වූ ලෙබනන හමුදාවේ නාවික සේනාංක කිහිපයක් ද මේ සඳහා යොදා ගැනීමට ඉඩ තිබේ. මින් සිදු වනු ඇත්තේ, 2000 වර්ෂයට පෙර පැවතුනු පරිදි, එනම් ෆැසිස්ට් වර්ගයේ ෆැලැන්ජිස්ට් බලකායන්ගේ නෂ්ටාවශේෂයක් වූ ඊශ්‍රායල-ගැති දකුනු ලෙබනන හමුදාව දේශ සීමා ප්‍රදේශය තුල ඊශ්‍රායලයේ පොලිස් හමුදාව ලෙස සේවය කල තත්වයන් යලිත් ඇති කිරීම ය. වඩාත් මූලෝපායික මට්ටමේ දී, හිස්බුල්ලා සංවිධානය පරාජය කිරීම වනාහි සමස්ත මැද පෙරදිග ම යටත් කර ගැනීමේ ඇමරිකානු-ඊශ්‍රායල ව්‍යාපෘතියේ අත්‍යන්ත කොටසකි.

බුෂ් පාලනාධිකාරය ඉරානය සමග යුද්ධයකට විවෘතව සූදානම් වෙමින් සිටීත එය මේ සඳහා ජාත්‍යන්තර න්‍යෂ්ටික බලශක්ති ඒජන්සිය සහ ඉරානයේ න්‍යෂ්ටික වැඩ පිලිවෙල පිලිබඳව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයට නිල වසයෙන් වාර්තා කිරීම පාවිච්චි කිරීමට යන්නේ, සදාම් හුසේන්ගේ පාලන තන්ත්‍රයට එරෙහිව ''මහා විනාශක අවි'' පිලිබඳ පව චෝදනාව යොදා ගත් ආකාරයට ම ය.

තම ඉරාක දිග්විජය තහවුරු කර ගැනීමට ද බැග්ඩෑඩය තුල ගැත්තර පාලනය ස්ථාවර කර ගැනීමට ද තමන්ට ඇති ප්‍රධාන බාධකය වන්නේ ඉරානය යැයි වොෂින්ටනය සලකයි. ඉරානයේ පවත්නේ යැයි කියනු ලබන න්‍යෂ්ටික බලාගාරවලට එරෙහිව එල්ල කෙරෙන ප්‍රහාරයකට වේවා, ඉරානයට එරෙහි ගොඩබිම් ආක්‍රමනයකට වේවා පෙරාතුව මැද පෙරදිග ප්‍රදේශයේ වෙනත් තැන්වල එරටට පවත්නා සහාය ස්ථාන විනාශ කර දැමීම ආක්‍රමනිකයාට අත්‍යවශ්‍ය වේ. දිගු කාලයක් තිස්සේ ඉරානය සමග සම්බන්ධකම් පවත්වා ගෙන යන හිස්බුල්ලා සංවිධානයට එරෙහි ප්‍රහාරය ද 1980 ගනන්වල ඉරාන-ඉරාක යුද්ධය සමයේ පටන් ඉරානය සමග යුද්ධමය වසයෙන් සන්ධානගතව පවත්නා සිරියාවට එරෙහිව යුද්ධ ප්‍රහාරයක් එල්ල කිරීමට ඇති තර්ජනය ද ගලා එන්නේ මෙතැනිනි.

පසු ගිය වර්ෂයේ දී - තව මත් හඳුනා ගෙන නැත්තා වූ බලවේගයන් විසින් - ලෙබනනයේ හිටපු අගමැති රෆික් හරිරි ඝාතනය කිරීම ප්‍රයෝජනවත් ව්‍යාජයක් ලෙස පාවිච්චි කර ගෙන ලෙබනනයෙන් සිරියානු හමුදාවන් ඉවත් කරවීමට ගෙන යන ලද ව්‍යායාමයට පිටුපසින් පවතින්නේ මෙම යුද සූදානම යි. ඒ සමයේ බුෂ් පාලනාධිකාරය සිරියානු හමුදා ඉවත් කරවීමට බල කිරීම මගින් ලෙබනනයේ ස්වාධිපත්‍යය යලිත් තහවුරු කිරීමේ ශුද්ධ වූ ව්‍යායාමයක් උදෙසා සහයෝගිතාව ප්‍රකාශ කිරීමට ප්‍රන්ස ජනාධිපති ජැක් චිරාක් සමග එකට එක් විය.

දශක ගනනාවක් තිස්සේ සිරියාව රැඳී සිටීමෙන් ඇති වූවාට වඩා අතිමහත් විනාශයක් එම කුඩා රට මතට සති තුනකින් පතිත කර ඇති ඊශ්‍රායල ප්‍රහාරය නැවැත්වීමට ඊශ්‍රායලයට කියා සිටින ලෙස ලෙබනන ආන්ඩුව තමන්ගෙන් කල ඉල්ලීම් ශාන්ත පීටර්ස්බර්ග්හි ජී-8 සමුලුවේ දී ප්‍රතික්ෂේප කිරීම මගින්, බුෂ් සහ චිරාක් යට කී තම ව්‍යායාමයේ නරුමත්වය දැන් පැහැදිලි කර ඇත.

(දෙවන ලෝක යුද්ධය කරා ලෝකය ලුහුටා යමින් පැවති සමයේ - පරිවර්තක) ජපානය මැන්චූරියාව අල්ලා ගත් කල්හි ද මුසොලිනී ඉතියෝපියාව ආක්‍රමනය කල කල්හි ද හිට්ලර් ඔස්ට්‍රියාව හා චෙකොස්ලෝවැකියාව අල්ලා ගත් කල්හි ද මහ බලවතුන් කුඩා හා දුර්වල රටවල වියදමෙන් තමන්ගේ ම අවශ්‍යතා බලා කියා ගත් 1930 ගනන්වල දුර්ගන්ධය දැන් ජී-8 සමුලුවෙන් ද වහනය වෙයි.

ප්‍රධාන අධිරාජ්‍යවාදී අපරාධකරුවා වන ජෝර්ජ් ඩබ්ලිව්. හිස්බුල්ලා සංවිධානය මත බලපෑම් කිරීමට නොකැමති වීම පිලිබඳව සිරියාව විවේචනය කරන අතරතුරේ දීත් තම ප්‍රධාන හවුල්කාර අපරාධකරුවා වන බ්‍රිතාන්‍යයේ ටෝනි බ්ලෙයාර් වෙත කුනුහරුප බසින් කඩා වැදීමේ දීත් බුෂ් යොදා ගත් ගොරහැඩි දාමරික කුනුහරුප මගින් පෙන්නුම් කරන්නේ කතා කරන වචනවලින් පවා එදා වාතාවරනය අද වාතාවරනයට කොතරම් සමානව පවතී ද යන්න යි.

ඊශ්‍රායල් පාලන තන්ත්‍රය යුද අපරාධයකට - එනම් ස්වයිරී යයි නම් කරනු ලැබූ රාජ්‍යයක ජනගහනය මත සාමූහික දඬුවමක් පැටැවීම - වැරදිකරුය යන්න පහසුවට අමතක කර දමා ඇත.

ඉරාක ආක්‍රමනයට සැරසෙන තතුතුල, බුෂ් පාලනාධිකාරය විසින් පෙර නුවූ විරූ මට්ටමක අන්තර්ජාතික ආක්‍රමනයක ව්‍යායාමයක් දියත් කිරීම පිලිබඳව තියුනු මත භේද තිබුනු අතර, දැන් යුරෝපීය ප්‍රභූව, සිරියාවට සහ ඉරානයට විරුද්ධව වොෂිංටනය සමග පෙල ගැසීම මගින් තමන්ගේ ආසක්තයන් වඩාත් හොඳින් ඉටු කරනු ලැබේ යයි තීන්දුවකට එලඹ සිටී.

පලස්තීනයන් කෙරේ ඊශ්‍රායල් පිලිවෙතේ සුලු සුලු ප්‍රශ්න පිලිබඳව වචන හරඹ කරන ලෙබනනය බෝම්බ වැසි වස්සා මුලුමනින් ම තලා දැමීම තුලින් ජාත්‍යන්තර නීතිය එලිපිටම සහ භයංකර ලෙස උල්ලංඝනය කර දැමීම නවත්වා දමන ලෙස බල කර සිටීමට එකදු යුරෝපීය බලවතෙකු හෝ සූදානම් නැත. ස්වයිරී රාජ්‍යයක් වූ ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෙකු වූ ද රටකට විරුද්ධව සිදු කරන ලද

ආක්‍රමනයට එරෙහිව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය කුමන පියවරක් හෝ ගත්තේ ද නැත.

ලෙබනනයේ වැඩ කරමින් හෝ නිවාඩුව ගත කරමින් සිටි ජී-8 රටවල පුරවැසියන් ඊස්රායල බෝම්බ මගින් මරා දමනු හෝ තුවාලවලට භාජන කරනු ලැබීමේ ඉඩකඩක් පවතීය යන්න පවා ඔවුහු ගනන් නොගත්හ. එක්සත් ජනපද පුරවැසියන් 25,000ක් ද, ප්‍රන්සයෙන්, ඉතාලියෙන්, බ්‍රිතාන්‍යයෙන් සහ වෙනත් රටවලින් තවත් දහස් ගනන් ද ඊස්රායලය විසින් ගුවන් හා මුහුදු මාවත් සිර කර දැමීම ද සිරියාවට යන මහ මාවත්වලට බෝම්බ දැමීම ද නිසා දැන් යනඑනමං නැතිව සිරවී සිටිති.

ජී-8 රටවල පුරවැසියන් මත ලෙබනන පරම්පරාවන්ට අයත් අය වන මින් බොහෝ දෙනෙක් දැන් මරන තර්ජනයට ලක්ව ඇත්තේ ත්‍රස්තවාදීන්ගේ අතින් හෝ හෙස්බුල්ලා තුවක්කුකරුවන් අතින් නොව, එක්සත් ජනපදය විසින් ආයුධ දී සන්නද්ධ කරනු ලැබූ, එක්සත් ජනපදය විසින් මුදල් සම්පාදනය කරනු ලබන බුෂ් පාලනාධිකාරයේ කැමැත්ත ඇතිව මෙහෙයවා තිබෙන යුද යන්ත්‍රයක් විසිනි.

හෙස්බුල්ලාවරුන්ගේ ස්ථාන යයි සිතනු ලැබූ තැන්වලින් බොහෝ ඈතට සඳුදා ඊස්රායල් ප්‍රහාර ගමන් කර තිබුනි. නගර මධ්‍යය සහ වරාය ප්‍රදේශවලට යලි බෝම්බ දමනු ලැබූ බීරූට් නගරයට අමතරව උතුරු ලෙබනනයේ අබ්දේ නමැති ධීවර වරායට ද, උතුරේ ෂියාවරුන් සමග සිතියහැකි මොනම සම්බන්ධයක් වත් නැති සුන්නි මුස්ලිම්වරුන් ගහනවූ ට්‍රිපොලි නගරයට ද රටේ නැගෙනහිර ප්‍රදේශයේ බාල්බෙක් නගරයට ද ඊස්රායල් යුද ගුවන් යානාවෝ බෝම්බ හෙලූහ.

සඳුදා අඩු වසයෙන් මිනිසුන් 43 දෙනෙකු මරා දමනු ලැබූ බැවින් මරන සංඛ්‍යාව දැන් 209ක් වී තිබෙන බවත් ලෙබනන නිලධාරීහු ප්‍රකාශ කලාහ. බීරූට් නගරයට දකුනේ රමෙයිලේ නමැති වෙරලාසන්න නගරයේ දී මිනිබසයකට ඊස්රායල් මිසයිලයක් එල්ල කිරීම නිසා එහි සිටි සිවිල් වැසියන් 12 දෙනෙක් මරනයට පත් වූහ. උතුරු ඊස්රායලයට ඇද වැටුනු හෙස්බුල්ලා මිසයිලවලින් එක් ඊස්රායල් ජතිකයෙක් හෝ මරනයට පත්වුනේ නැතඃ සුලු ගනනකට තුවාල සිදු විය.

සඳුදා ලෙබනන ජනතාව අමතා කතා කල අගමැති ෆුවාඩ් සිනියෝරා - මොහු පත් වූ අවස්ථාවේ එය ලෙබනනයේ ස්වාධීනතාවය ලත් ජයග්‍රහනයකැයි බුෂ් පාලනාධිකාරය විසින් ඉහලින් වර්නනා කරනු ලැබුනි - ඊස්රායල් ආක්‍රමනය මෙසේ හෙලා දුටුවේ යඃ " ත්‍රස්තවාදය පිලිබඳව සෙසු අයට චෝදනා කරන ඊස්රායලය, අන් සියල්ලන්ටමත් වඩා දරුනු ආකාරයකට එය ක්‍රියාත්මක කරයි."

ඊස්රායල් ගොඩබිම් හමුදාවන් ලෙබනන සීමාවේ රැස් කර ඇති අතර එක් හමුදා ඒකකයක් ලෙබනනය තුලට කෙටි කඩා වැදීමක් කලේ ය. පසු ගිය සඳුදා ඊස්රායල් හමුදා බටහිර ඉවුරේ අතිරේක හටයන් දහස් ගනනක් සේවයට කැඳවී ය. මේ අනුව පලස්තීන ප්‍රදේශයේ සිට නිත්‍ය හමුදා විශාල කොටසක් ලෙබනන සීමාවට මාරුකර යැවිය හැකිය.

හෙස්බුල්ලා රොකට් ප්‍රහාර නැවැත්වීමට සිරියානු ජනාධිපති බෂාර් අසාද් පැය 72ක් ඇතුලත මැදිහත් වූයේ නැති නම් සිරියාව ඇතුලතම තාක්ෂනික ගොඩනැගිලිවලට බෝම්බ දමන බවට ඊස්රායලය තර්ජනය කර තිබේ යයි අඩු ගනනේ එක් පුවත්පත් වාර්තාවක සඳහන් විය. මේ පිලිබඳව පෙන්ටගන් මූලාශ්‍රිතව, *අල් හයාක්* නම් අරාබි පුවත්පත මුලින් පල කල වාර්තාවක් *හාරෙට්ස්* නම් ඊස්රායල් පුවත්පතේ ද පලවිය. එවන් ප්‍රහාරයක් දැන් ඉරාකය අල්ලාගෙන සිටින ඇමරිකානු හමුදාවල, සිරියානු දේශ සීමාවට ආසන්න අන්බාර් ප්‍රාන්තයේ රැඳී සිටින දහස්ගනන් ඇමරිකානු හටයන් සමග ඒකාබද්ධ කොට මෙහෙයවෙනු ඇත.

ඇමරිකාව ලෙබනනයට කෙලින්ම මැදිහත්වීමේ ඉඩකඩ ද එන්න එන්නම වැඩිවෙයි. ජෝර්දානියානු හමුදා සමග එක්ව අභ්‍යාසවල යෙදී සිටි අකබා බොක්කේ සිට ගමන් කරමින් සිටින එක්සත් ජනපද නාවුක හමුදාවේ ඉවෝ ජිමා නෞකාවත් ඒහා යන තවත් කුඩා නැවුත් ඇමරිකානු සමුද්‍රගත බලකායේ 2,200ක් ප්‍රවාහනය කරමින් සිටිති. ඊජිප්තුවේ අවසර ඇතුව සුවස් ඇල හරහා ගමන් කොට අඟහරුවාදා වන විට ලෙබනනයේ වෙරලට බටහිරින් ප්‍රවිශ්ට වීමට මොවුන් සූදානම් ය. 24 වන සමුද්‍රගත ප්‍රහාර ඒකකයේ හෙලිකොප්ටර දැනට ම බීරූට් නුවර හා සයිප්‍රසයේ එක්සත් ජනපද තානාපති කාර්යාලවලට හටයින් සුලු ප්‍රමානයක් බස්සා ඇත.

ජී-8 කන්ඩායමේ අකර්මන්‍යතාව ද මහ බලවතුන්ගේ නරුම ආකල්පය ද ඊස්රායල පාලන තන්ත්‍රයේ ආක්‍රමනකාරීත්වයට ඉන්ධන සපයනු ඇත; එමගින් ඔවුන් කරනු ඇත්තේ ලෙබනනයේ ද, ඊස්රායලයේ ද, පලස්තීනයේ ද මුලු මහත් මැදපෙරදිග ද ජනතාව මත මීටත් වැඩි මහා ව්‍යසනයක් කඩා පාත් කිරීම ය.

© www.wsws.org